**රඹෑව ප්‍රාදේශීය සභාව - 2020 වාර්තාව**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

රඹෑව ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රඹෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) උතුරු මැද පළාත් පාලන කොමසාරිස් විසින් 2019 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද අංක 2019/02 දරණ චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නව ගිණුම්කරණ ක්‍රමයට අනුව ඉදිරිපත් කර ඇති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂය සමඟ සැසඳිය නොහැක.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජංගම වත්කම් ලෙස දැක්විය යුතු නොපියවන ලද රු.1,150,965 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ජංගම වත්කමක් ලෙස දැක්විය යුතුවේ. |
| (ආ) | මුදල් පොතට අනුව පළාත් පාලන සංවර්ධන සහයක ව්‍යාපෘති බැංකු ගිණුමේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු.1,742,335 ක් වුවත් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ එය රු.1,779,035 ක් ලෙස දැක්වීම නිසා සභාවේ මුදල් හා මුදල් සමාන දෑ රු.36,700 කින් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | මූල්‍ය ප්‍රකාශනවල වෙනස හඳුනාගෙන නිවැරදි ශේෂය ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා ගොවි සංවිධානයකට රු.393,123 ක් ගෙවීමට තිබුණු නමුත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.483,816 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සභාවේ ණයහිමියෝ රු.90,693 කින් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි ශේෂය ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඈ) | ව්‍යාපෘති ප්‍රගති වාර්තා අනුව කර්මාන්ත ණයගැතියෝ රු.393,123 ක් වුවත් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ එය රු.460,636 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ජංගම වත්කම් රු.67,513 කින් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි ශේෂය ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | විස්තීරණ ආදායම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනා නොගත් රු.3,843,623 ක ප්‍රාග්ධන ප්‍රදානය වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ ගිණුම්ගත කර නොතිබුණි. | මෙම වටිනාකම අතිරික්තයට ගලපා ශුද්ධ එකතුව වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ මුළු එකතුව සටහන් කර ඇත. | මෙම වටිනාකම වත්කම් වගකීම් ප්‍රකාශයේ පෙන්නුම් කළ යුතුවේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ අවසන් මාස 06 ට අදාළව ලැබිය යුතු උසාවි දඩ ආදායම් රු.887,921 ක් තක්සේරු කර ගිණුම්ගත නොකිරීම නිසා වර්ෂයේ ලාභය හා ලැබිය යුතු ආදායම් එම වටිනාකමෙන් අඩුවී තිබුණි. | පිළිගනිමි. | නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කළ යුතුවේ. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.1,332,020 ක් වූ පුස්තකාල පොත් පිළිබඳව වත්කම් වගකීම් ප්‍රකාශයේ හෝ සටහන් තුළින් හෙළිදරව් කර නොතිබුණි. | පිළිගනිමි. | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ක්‍රියාකළ යුතුවේ. |

## 2. **මූල්‍ය සමාලෝචනය**

### 2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.14,817,273 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,061,424 ක් විය.

### 2.2 **ආදායම් පරිපාලනය**

#### 2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.841,704 ක හිඟහිටි වරිපනම් ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | ද්වි ගණන දෝෂ හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර ඇති අතර හිඟ වරිපනම් ගෙවන ලෙස රතු නිවේදන නිකුත්කර ඇත. | හිඟ වරිපනම් අයකර ගැනීමට ක්‍රියා කළයුතු වේ. |

**(ආ) කුලී**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කාමර කුලියට දීමෙන් සහ වෙළඳ අයිතීන් බදුදීම වෙනුවෙන් අයවිය යුතු රු.1,489,533 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් වටිනාකම රු.6,390,000 ක්වූ කැබ්රථය 2019 මැයි 16 දින අනතුරට පත්වීම සම්බන්ධයෙන් එයට වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගත යුතු රු.1,583,250 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කර ඇත. | මෙම මුදල් එයට වගකිවයුතු පාර්ශවයන්ගෙන් කඩිනමින් අයකරගත යුතුවේ. |

### 3.2 නිශ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ පැරණි පුස්තකාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට රු.2,978,302 ක් වැයකර තිබුණද එහි වැඩ නිමකර ඵලදායී ලෙස භාවිතා කළ හැකි තත්ත්වයට පත්කිරීමට කටයුතු කර නොතිබුණි. | කළවැඩ වෙනුවෙන් රු.2,978,302 ක් සභාවෙන් ගෙවා ඇති අතර අතරුදවුම් රු.324,148 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් නිදහස් කර ඇත. | ඉතිරි වැඩ ඉටුනොකර අතරුදවුම් මුදල් ගෙවූ නිලධාරීන්ගෙන් එම මුදල් අයකළ යුතුවේ. |